# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.12.08<br>පැය 1245 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/2784/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


**පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල නිරාවරණය වී ඇති විදුලි සංදේශ රැහැන් වලට හානි කිරීම හා කපා ඉවත් කිරීම වැළැක්වීම සඳහා මහජන සහාය ඉල්ලා සිටීම.**

දිවයින පුරා පැවති දැඩි ආපදා තත්ත්වය හේතුවෙන් අත්‍යාවශ්‍ය සන්නිවේදන රැහැන් (Fibre Optics සහ තඹ) කේබල් වලට හානි වී හෝ පොදු ප්‍රදේශවල ඒවා නිරාවරණය වීම හේතුවෙන් යම් තැනැත්තන් විසින් මෙම රැහැන් විශාල වශයෙන් කපා ඉවත් කිරීම සිදු කර ඇති බවත් එම හානි වලක්වා ගැනීම සඳහා මෙම තත්ත්වය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කරන ලෙසටත් ඩයලොග් ආසියාටා සමාගම විසින් පොලිස්පතිතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

ආපදාවට ලක් වූ මාර්ග නැවත අළුත්වැඩියා කිරීමේදී ද භූගත විදුලි සංදේශ රැහැන් වලට හානි සිදුව ඇති බවටත් එම සමාගම වැඩිදුරටත් දන්වා ඇත.

මෙම තත්ත්වය සන්නිවේදන පහසුකම් කඩිනමින් යථාවත් කිරීමේ කාර්යයට දැඩි ලෙස බලපා ඇත. එබැවින් ආපදා තත්ත්වයෙන් නිරාවරණය වී ඇති සන්නිවේදන රැහැන් වලට හානි කිරීම, එවැනි රැහැන් කපා ඉවත් කිරීම, ළඟ තබා ගැනීම හෝ එවැනි පද්ධති වලට හානි සිදු කිරීම නොකරන ලෙසත් එවැනි ක්‍රියාවන් සිදු කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන බවටත් පෙන්වා දෙන අතර මෙවැනි ක්‍රියා සිදු කිරීම සම්බන්ධව තොරතුරු වාර්තා වේ නම් ආසන්නතම පොලිස් ස්ථානය දැනුවත් කරන ලෙසට ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

එසේම යම් ආපදාවකට ලක් වූ මාර්ගයක් නැවත සකස් කරන අවස්ථාවන් වලදී මෙවැනි භූගත විදුලි සංදේශ රැහැන් නිරීක්ෂණය වන්නේ නම් අදාල ආයතනයන් වලට දැනුම් දීමට කටයුතු කරන ලෙසට මහජනතාව කාරුණිකව දැනුවත් කරන අතර එමඟින් මෙම ආපදාවන් යථාවත් කිරීම සඳහා ගනු ලබන ප්‍රයත්නයන් වඩාත් කාර්යක්ෂමව සිදු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**